# උමාගේ කොටි පැටියා



**පියුමංසි උමායා මාපාබණ්ඩා**

# උමාගේ කොටි පැටියා

**පියුමංසි උමායා මාපාබණ්ඩාර**

**කතෘ**

**කතෘගේ වෙනත් කෘති**

- පැණි පුහුල් ගෙඩිය
- මගේ පුංචි තුන් ඉරිඅප්පු
- අපූරු යාලුවෝ
- මායා මැණික සොයාගත් වික්‍රමය
- බංගලාවේ අභිරහස

මහාමායා බාලිකා විදුහල
5 ශ්‍රේණිය A
2025/02/08

**IS137216**

# පිදුම

දිවා රෑ වෙහෙසී මගේ අනාගතය වෙනුවෙන් ඇප කැප වන

මගේ ආදරණීය අම්මාට, අප්පච්චීට, සහ මා පුංචි කාලයේ සිට

රැක බලාගත් කිරිඅම්මාට, කිරිඅත්තාට සහ මෙම පොත

ලිවීමට උනන්දු කර වූ අපේ ආදරණීය සමන්මලී ගුරු මෑණියන්ටත්

ප්‍රාථමික අංශයේ පන්තිභාරව සිටි අමිතා ගුරු මෑණියන් ඇතුළු සියලුම මෑණිවරුන්ටත්, පියවරුන්ට

සහ මගේ

පංතියේ සියලු ම මිතුරියන්ට පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේදනිසාය. එසේ නම්මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියත් ගොඩනඟා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමන් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්තදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රටතුල යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් තුල යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන හෙරණගත්කරණි ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ඇති කරන්නට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය

ශෂිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

අදත් හරිම ලසන්න දවසක්..........උමා උදේ ම නැගිටලා පාසල් යන්න සූදානම් උනා." අද මොකක් හරි අමුත්තක් තියෙනවා ." උමාට එක පාරටම සිතුණා.පාසල් බස් රථය පැමිණ ඇති නිසා උමා ඉක්මනින් නිවසින් පිටත් වුණා ය. පාසලේ දී උමාට මලිත් ව හමු විය. " සුබ උදෑසනක් මලිත් " " සුබ උදෑසනක් උමා." ඒක නෙවෙයි අද මොකක් හරි අමුත්තක් තියෙනවා කියලා මට හිතෙනවා ." මලිත් මෙසේ පවසන විට උමා පුදුම වී මෙසේ පැවසුවාය. " අනේ ඔව් මලිත් මට මොකක් හරි අමුත්තක් දැනෙනවා." දෙදෙනා කතා කරමින් පන්තියට ගියෝය. " ආ.......ඇයි තාම කවුරුත් නැත්තේ ?" විස්මයෙන් බලා ආවේය. " මේ යාළුවනේ එන්න එළියට. කැලෑව පැත්තෙ අමුතු කොටියෙක් ඉන්නවා." එහෙම කියාන ගීත්මා මලිත් සහ උමාවත් ඇදගෙන කැලෑව පැත්තට දිව ගියාය.



කැලෑවෙ සිටි කොටියා ව ඒ වෙනකොටත් වනජීවී නිලධාරීන් විසින් කූඩුවකට කොටු කරගෙන. " මේ කොටියා තාම පොඩි පැටියෙක්.පුදුමයට කරුණ තමයි මෙයා කොහොමද මෙහෙම ආවෙ කියලා . " වනජීවී නිලධාරීන් පැවසීය. උමා හොඳින් ළං වෙලා බලා මෙසේ පැවසුවා. " අනේ මාමේ, මෙයාව

අපට තියාගන්න බැරි ද?" "ඒක කරන්න පුළුවන් දෙයක් නෙවෙයි දරුවෝ" විදුහල්පතිතුමා සැණකින් කීවේය. උමා නැවතත් කොටි පැටියාට ලං වී බැලුවාය. එවිට උමා කොටි පැටියාගෙ ගෙලේ සහ පාදයේ තුවාල ඇති බව දුටුවාය. මේ බව ගීත්මාට සහ මලිත්ට පවසා මෙසේද පැවසුවාය .අපි ප්‍රින්සිපල් සර්ගෙන් අහමුද කොටි පැටියාට බෙහෙත් කරන්න තියා ගන්නද කියලා " ඉතින් මේ තුන්දෙනා විදුහල්පතිතුමාගෙන් මේ පැනය අසන ලදි. නමුත් විදුහල්පතිතුමා ටත් ප්‍රථම පිළිතුරු දුන්නේ මනුකය. "ඒ හරියන දෙයක් නෙවෙයි මේ කොටියා අපට කරදර කරාවි." එසේ කියා අවසන් වනවාත් සමඟ ම කොටි පැටියා ගෙරවීය.මනුක බිය වී පිටුපසට පැන්නේය .අනෙකුත් ළමයි ඇතුළු විදුහල්පතිතුමාටත්, ගුරුවරුන්ටත් , වනජීවී නිලධාරීන්ටත් මෙයට හොඳටම සිනහා පහළ විය. ලැජ්ජාවෙන් රතු වූ මනුක ඔහුගේ යහළුවන් දෙදෙනා සමඟ වේගයෙන් පන්තියට දිව ගියේ ය.

උමා නිවසට ගියේ අද සිදුවූ දේවල් මවට පැවසීමට ඇති වැඩි උනන්දුවත් සමඟයි උමා නිවසට යන අතරතුරත් සිතුවේ කොටි පැටියා ගැනයි. කොහොමද කොටි පැටියාව රැකබලා ගන්නේ. ඒ විතරක් නෙවෙයි. මනුකවත් එකතු කරගෙන ගන්න ඕනේ. "මනුකව සත්තුන්ට කරුණාවෙන් සලකන කෙනෙක් කරන්න ඕන. " නිවසට යන තෙක්ම උමා සිටියේ කොටි පැටියා ගැන සිත සිතාය. ඒ නිසාම පාසල් බස් රථයේ මාමා බහින්න පවසන තෙක්ම නිවස ළඟ සිටින්නේ කියා ද අමතක වුණාය. කොහොම හරි ගෙදර ගිය ගමන් කරේ අම්මාට මේ අපූරු විස්තරේ කියපු එක. අම්මා උමා කියන සෑම දෙයක්ම හොඳින් අසා සිටියා ය. එහෙනම් හෙට උදේම ගිහින් කොටි පැටියාට සාත්තුව පටන් ගන්න. අවසානයේ උමාගේ අම්මා කියා සිටියා ය. උමා ද එයට එකඟ විය.

ඊළඟ දවසේ උදේම පාසලට ගියපු සැනින් උමා කළේ කොටි පැටියාට කෑම දුන්න එක. "සුබ

උදැසනක් උමා" ගීත්මා උමා දෙසට දිව එමින් පැවසුවා ය. "ඔබටත් සුබ උදැසනක් ගීත්මා, මේ බලන්න කොටි පැටියා ගොඩක් බඩගින්නෙ ඉඳලා වගේ. මම ගෙනාපු ඔක්කොම මස් කෑවා." ගීත්මා එය අනුමත කරමින් හිස වනා සිනාසුනා ය. "අපූරුයි, දැන් එයා ඔයත් එක්ක හොඳටම යාළුවෙලා. වගේ එහෙම නේද?" මේ දෙදෙනා ළඟට පැමිණි මලිත් පැවසුවේ ය. මලිත් ඔහු අතේ තිබූ විස්කෝතු කැබැල්ලක් කොටි පැටියාට දුන්නේ ය. ඌ එයද ආහාරයට ගත්තේ මීට කෙටි වේලාවකට පෙර කිසියම් දෙයක් ආහාරයට නොගත් පරිද්දෙනි. මේ දැක යහළුවෝ තුන්දෙනාටම සිනහ පහළ විය. ඔය අතරතුර මනුක පැමිණෙනවා දුටු මලිත් මනුකට ද ඔවුන් සමග එකතුවන ලෙස පැවසුවේ ය. බියෙන් බියෙන් මනුක කොටි පැටියා අසලට පැමිණියේ ය."බය වෙන්න එපා. එයා ඔයාට කරදර කරන්නේ නෑ.ඔයා මෙයාගෙන් සමාව ගන්න. එතකොට එයත් ඔයත් එක්ක යාළු වෙයි" මෙය අසා සිටි මනුක කොටි පැටියාගෙන් සමාව ගත්තේ ය. කොටි පැටියා ද

සමාව දෙන්නාක් මෙන් "පුරු...පුරු...පුරු" ගෑවේ ය. මනුකට ගොඩක් සතුටු සිතුනේ ය. එදින විවේක කාලයේ දී මනුක තම ආහාරයෙන් කොටසක් කොටි පැටියාට දුන්නේ ය.කොටි පැටියා තව තවත් මනුකට සමීප විය. විදුහල්පතිතුමා ද මෙය දැක ප්‍රසංශා කළේ ය. පසු දින පශු වෛද්‍ය කෙනෙකුද කැටුව උමා පාසලට පැමිණියා ය. වෛද්‍ය තුමා කොටි පැටියාව පරීක්ෂා කළේය. පසුව උෟට අවශ්‍ය ප්‍රතිකාර කර ඖෂධ නියම කළේය. සෑම දිනකම උමා යහළුවන් සමඟ එක්වී කොටි පැටියාට බෙහෙත් පෙව්වේය. කොටි පැටියා අදිමදි කරමින් බෙහෙත් බිව්වේය. දින ගත වීමත් සමඟ කොටි පැටියා මිනිසුන්ට හුරු විය. ඒ වගේම ටිකෙන් ටික ලොකු විය. කාලය ගත වුණි. කොටි පැටියා දැන් හොඳින් වැඩුණු පෘෂ්ඨිමත් කොටියෙක් බවට පත්ව අවසානය. එම නිසා කොටි පැටියා වනජීවී නිලධාරීන්ට භාර දීමට විදුහල්පතිතුමා සිතුවේය. බව උදෑසන රැස්වීමේදී ළමයින්ට දැන්වූයේ ය. මේ අසා සියලුම ළමයි ශෝකයට පත් වූහ. අන්

කාටත් වඩා දුක් වූයේ උමා, ගීත්මා, මලිත් සහ මනුක. නමුත් දැන් කුමක් කරන්නද? මන්ද, කොටියාට සුව වූ විගස නැවතත් භාර දෙනවයි කියූ නිසා. සුව වී බොහෝ කාලයක්ද ගතවී තිබෙන්නේ තිබෙන්නේ. එදිනට පසුදිනම වනජීවී නිලධාරීන් පැමිණ කොටියාව රැගෙන ගියෝය. උමා සහ යහළුවෝ අවසානයේ සතුටු වූයේ කොටියාට උගේ ජීවිතය නැවත ලැබෙන නිසා ය.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මකක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍යය කෙතේ ලේඛක රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන්වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ.

සම්බන්ධීකාරක.

සෙනවිරත්න මහලේකම්.

**IS37218**